State Government Victoria
Department of Education and Early Childhood Development

*'නිරීක්ෂණය මගින් වැඩ පිළිබඳව ඉගෙනීම'*

# වැඩ හුරුව

සිසුන්ට,දෙමාපියන්ට සහ රැකබලාගන්නන්ට මගපෙන්වීමක්

Work Experience - Sinhalese

## වැඩ හුරුව යනු කුමක්ද?

වැඩ හුරුව යනු බොහෝවිට පළමුවෙනි වතාවට සිසුන්ට වැඩ ජීවිතය පිළිබඳ අත්දැකීමක් ලබාදෙන පාසැලේ අධ්‍යාපන වැඩසටහනේ කොටසකි. එය කර්මාන්ත හා ඔවුන්ව ස්ථාපනය කරන ලද වැඩපළවල් පිළිබඳව නියම තත්වය අවබෝධකරගැනීමට, ද්විතීයික පාසැල් සිසුන් සේවායෝජකයන් සමග කෙටිකාලීනව ස්ථානගතකිරීමකි. සිසුන්ව සේවායෝජකයන් සමග ස්ථානගතකරනු ලබන්නේ, මූලිකව නිරීක්ෂණය කිරීමට හා ඉගෙනුමට මිස, පුළුල් පුහුණුවීමක් හෝ විශේෂඥතාවයක් අවශ්‍යවන ක්‍රියාකාරකම් බාරගැනීමට නොවේ. මෙය සේවායෝජකයාගේ ස්ථානයේදී කිරීමට බාරගන්නා අතර, එමගින් පහත දැක්වෙන අවස්ථා සපයන හෙයින් සිසුන්ට අතිමහත් වාසි ලබාදෙයි.

- වැඩ පිළිබඳව අවබෝධයක් ලබාගනිමින් කණ්ඩායමක කොටසක් වශයෙන් වැඩිහිටියන් සමග එකට වැඩ කිරීමට
- නව කුසලතා පරාසයක් සංවර්ධනය කරගැනීමට හා පුහුණුවීමට
- වැඩි ස්වාධීනතාවයක් හා ආත්ම විශ්වාසයක් ඇතිකරගැනීමට
- පාසැල් විෂයමාලාව වැඩපළට සම්බන්ධ කිරීමට
- ඔවුන්ගේ අධ්‍යයන තවදුරටත් කරගෙනයාම සඳහා උද්යෝගය වැඩිකිරීමට සහ/ හෝ තවදුරටත් පුහුණුවීම බාරගැනීමට
- වෘත්තීන් සඳහා විකල්ප ගවේශණය කිරීම

ස්ථානගත වූ කාලය තුළ ගුරුවරයෙකු ශිෂ්‍යයාව අමතනු ඇත. දෙමාපියන්ට කිසියම් ගැටලුවක් ඇත්නම් පාසැලට ඇමතිය හැකිය. ඇමතීම සඳහා අවශ්‍ය විස්තර අන්තිම පිටුවෙහි දැක්වේ.

## වැඩ හුරුව කළහැක්කේ කෙදිනකද?

සාමාන්‍යයෙන් වැඩ හුරුව සම්පූර්ණ කරනුයේ වසර 9 සහ 10 දීය. කාල පරාසය පාසැල මත පවතී. බොහෝ පාසැල් වලට වෙන්කරගත් වෙනම කාලයක් ඇත. වෙනත් අය වසර තුළ කුඩා සිසු කංඩායම් නිදහස් කරනු ඇත. පාසැල් නිවාඩුකාලවල ස්ථානගතවීම බාරගැනීමට තවත් සමහර පාසැල්, උනන්දුකෙරේ. කෙසේවෙතත් වසර අවසාන නිවාඩු කාලයේ වැඩ හුරුව කළ නොහැකිය.

එක් වාරයකට උපරිම දින 10 ක් හෝ වසරකට දින 40 ක් සිසුන්ට වැඩ හුරුව කළ හැකිය.

## දෙමාපියන් විසින් උදව් කළ හැක්කේ කෙසේද?

ඔබේ පුතා/දුව පළමුවෙනි වතාවට වැඩ හුරුව හරහා වැඩ ලෝකයට පිවිසෙන අවස්ථාව සිත කළඹන වෙලාවකි. මේ සම්බන්ධයෙන් උදව්වීමට ඔබට කළහැකි දේවල් කීපයක් ඇත.

- ස්ථාපනයන් පිරිනැම්ම තුලින් සේවායෝජකයා පෙන්වන යහපත් චේතනාව තේරුම් ගැනීමට ඔබේ දරුවාට උදව් කරන්න.
- ඔවුන්ට බාරවිය හැකි වැඩවල සවභාවය පිළිබඳව යථාර්තවාදී බලාපොරොත්තු ඇතිකරගැනීමට උනන්දුකරන්න. ඔබේ ළමයාට පුහුණුවක් ඇති අය කරන වැඩ කිරීමට නුපුළුවන් වේවි. නමුත් නිවැරදි හැඳින්වීමකින් හා නිතර අධීක්ෂණය යටතේ සරල ක්‍රියාකාරකම් කළ හැකිය. වැඩ දවස පාසැල් දවසකට වඩා දීර්ග වනු ඇත.
- වැඩ හුරු සැලැස්මේ ආකෘතිපත්‍රය නිවැරදිව පුරවා එය වහාම පාසැලට යවන්න. සේවායෝජකයා හා ශිෂ්‍යයා යන දෙදෙනාටම පිටපතක් බැගින් ලැබෙනු ඇත. මුල් පිටපත පාසැල තබාගනු ඇත.

  ඔබේ දරුවාගේ වැඩ හුරුවට බලපාන කිසියම් සෞඛ්‍යමය කරුණක් වෙතොත් පාසැලට දන්වන්න.
- OHS හි වැදගත්කම සහ ඔවුන්ගේ වගකීම් පිළිබඳව ඔබේ දරුවාට කතාකරන්න. අවශ්‍යකරන මොඩියුල සම්පූර්ණ කිරීමෙන් පසු වැඩ හුරුව ආරම්භ කිරීමට ප්‍රථම, ඔවුන්ගේ පාසැලෙන් සිසුන්ට ප්‍රදානය කරන safe@work සහතිකය බලන්න කියන්න.
- ආරක්ෂිතව වැඩට යාමට සහ එමට ගමනාගමනය සංවිධානය කරගැනීමට ඔබේ දරුවාට උදව් වන්න.
- ඔබේ දරුවාගේ වැඩ හුරු ස්ථාපනය ගැන සාකච්ජාකරන්න. එමෙන්ම ඇතිවියහැකි එසේ නැතහොත් දැකිය හැකි ගැටලු ගැන සාකච්ජා කරන්න.
- ඔබේ දරුවා වැඩට නොගියේ නම් හෝ සථාපනය පිළිබඳ ගැටලු ඇත්නම් වහාම පාසැලට දන්වන්න.
- වැඩ හා රැකියා පිළිබඳව දරුවාට කතා කරන්න. ඇතිතරම් විකල්ප සලකාබැලීමට උනන්දුකරන්න.
- පාසැලේ ඔබේ දරුවාගේ වෘත්තීය සම්බන්ධීකරුට කතාකරන්න.






සෑම ළමයෙක්ටම, සෑම අවස්ථාවක්ම



## ශිෂ්‍යයාගේ බලාපොරොත්තු මොනවාද?

වැඩහුරු කාලය තුළ සැමවිටම අවධාරණය කරනුයේ වටිනා සහ විනෝදජනක ස්ථාපනයක් ලබාදීම ගැනයි. වටිනා ඉගෙනුම් අත්දැකීමක් සහතිකවීමට සැකසුම් කීපයක් කළ යුතුවේ. පහත දැක්වෙන කරුණු ගැන සිසුන් උනන්දුකෙරේ:

- පුළුවන් සෑම අවස්ථාවකම ඔවුන්ටම ඔවුන්ගේ ස්ථාපනය සොයාගැනීමට. කෙසේවෙතත් සිසුන්ට උදව්වීමේ හැකියාව පාසැලට ඇත.
- වැඩහුරු සැලසුම් ආකෘතිපත්‍රය සම්පූර්ණ කිරීම හා එය වහාම පාසැලට යැවීමට
- වැඩ හුරුවට පෙර නියමිත safe@work වෘත්තීයමය සෞඛ්‍යය හා ආරක්ෂාව මොඩියුල් සම්පූර්ණ කිරීමට. සිසුන්ට සහතිකයක් ලැබෙනු ඇත.
- ස්ථාපනය වු කාලය තුළ වැඩපළේ රීති වලට, එමෙන්ම ඔවුන්ගේ අධීක්ෂකයාගේ උපදෙස් වලට එකගවෙමින් සේවයයෙකු ලෙස හැසිරීමට.
- වැඩ හුරුව ලබාගන්නා විට සිසුන් පාසැල නියෝජනය කරන බවත්, පාසැලේ ප්‍රතිපත්ති සහ හැසිරීම් පද්ධතිය සෑම අවස්ථාවකටම බලපවත්වන බවත් මතක තබාගැනීමට.
- ස්ථාපනයවීමේ කාලය තුළ පාසැල මගින් දෙන ලද සියළුම ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට.
- ස්ථාපනයේ දී දැනගන්නට ඉඩඇති රහසිගත සහ සංවේදී තොරතුරු පෞද්ගලිකව තබාගතයුතු බව තේරුම්ගැනීමට.
- දූරකථන පාවිච්චිය, අන්තර්ජාලය, ජායාපිටපත්කිරීම ආදී සියළුම කාර්යාල උපකරණ වැඩ අරමුණු සඳහා පමණක් බව තේරුම් ගැනීමට.
- සේවායෝජකයා ඉල්ලාසිටි පරිදි නියමිත පාවහන්/ ආරක්ෂිත ඇඳුම්/ නිළ ඇඳුම් ඇඳීමට.
- ස්ථාපනය අවසානයේ සේවායෝජකයාගේ ප්‍රතිචාර ලබාගැනීමට හා ස්තුතිකිරීමට.

## ගෙවීම

සිසුන්ට අවම ගෙවීම් අනුපාතිකය දිනකට ඩොලර් 5 කි.

ස්ථාපනය කොමන්වෙල්ත් දෙපාර්තමේන්තුවක හෝ පනතකට අනුව ස්ථාපිතකළ ආයතනයක නම්, අධ්‍යාපනික, පුණ්‍යායතනයක හෝ එසේ නැතහොත් ලාබ නොලබන ප්‍රජා ශුභසාධන සංවිධානයක නම් සිසුන්ට ගෙවීම් නොකරනු ඇත.

## ආබාධිත සිසුන්

ආබාධිත සිසුන්ට ඔවුන්ගේ පෞද්ගලික අධ්‍යාපන වැඩසටහන් ඇතුළත ඇතැම් කුසළතා සංවර්ධනය කිරීමට අමතර කාළයක් අවශ්‍යවේ යයි තීරණය කළහොත්, ඔවුන්ගේ වැඩ හුරු ස්ථාපනය දීර්ඝ කළ හැකිය.

## සේවායෝජකයන්ගේ යුතුකම් මොනවාද?

ආරක්ෂාව සහිත හා අසාධාරණයෙන් තොර වැඩපළවල් පාලනය වන සියළුම ප්‍රාන්ත හා පෙඩරල් නීති වලින්, ඕනෑම සේවයයෙකු මෙන් සිසුන්වද ආරක්ෂාවේ. වැඩපළවල් වෘත්තීයමය සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඳ සියලුම නීති රීති අනුගමනය කළ යුතුය. එමෙන්ම ඔබේ දරුවාට ආරම්භක පුහුණුවක් හා ප්‍රමාණවත් අධීක්ෂණයක් ලබාදිය යුතුය. එම පුහුණුව හා අධීක්ෂණය, ඔබේ දරුවා අධීක්ෂණය කිරීමට හෝ නිරීක්ෂණයට බලාපොරොත්තුවන කර්තව්‍යයන්ට සම්බන්ධතාවයක් ඇති එකක් විය යුතුය. ස්ථාපනය වු කාලය ඇතුළත ඔබේ දරුවාට තුවාලයක් සිද්ධුවුවහොත්, සේවායෝජකයා ඔබට හෝ රැකබලාගන්නා ට සහ පාසැලට හැකි ඉක්මනින් දැන්විය යුතුය.

## වැඩ හුරුව

*'වැඩ ගැන ඉගෙනීම'*

වැඩිදුර තොරතුරු සඳහා ඔබේ ප්‍රාදේශීය පාසැල ට අමතන්න.